කරන්න මදාරා"

"ඔයා තරහ ගන්න අවශ්‍ය නැහැ අසංග.. ඔයා මොකටද මගේ ප්‍රශ්න වලට තරහ ගන්නෙ..?" මදාරා ඔහු වෙතින් දෑස් ඉවත් කර ගනිමින් කීවා ය. අසංග දිග හුස්මක් ඇද ගනු ඇයට ඇසුණි. ආපසු හැරී බලන විට ඔහු බා ගත් හිසින් යුතුව ඉවතට යමින් සිටියේ ය. සමුගැනීමට හෝ නොවෙහෙසී ඔහු ඉවතට යනු ඇය බලා සිටියේ හැඟීම් විරහිතව ය.

"අද හවස එන්න.." සූරියබණ්ඩාර ගේ පහත් කටහඬ කල්පනාව අතරේ ම මදාරාට ඇසුණි.

"මං දැන් දවස් දෙකක් ආවා.. මට ආයෙ එන්න බෑ සර්.." මදාරා මුරණ්ඩු ලෙස කීවා ය. ඔහු ඔලොක්කුවෙන් සිනාසුණේ ය.

"ඔයාට එන්නම වෙනවා.." ඔහු කීවේ ඇය පසුකර ඉදිරියට යන අතර ය. "තවම ෆයිනල් එක්සෑම්ස් ඉවර නැහැ.." ඔහු නොකියා කීවේ එය නොවේ ද? අවසන් විභාග නිම වන තුරු තව කොපමණ දින ගණනක් මේ ගෙවීම කරන්නට සිදුවනු ඇතිද?

"අවස්ථාවාදියා.." මදාරා සිතින් කීවා ය. සිරුර කෝපයෙන් ගිණියම්වනු ඇයට දැනුණි. මේ ගණුදෙනුවෙන් අසාධාරණ වාසියක් ගන්නට මේ මිනිසා උත්සාහ ගන්නා බව පැහැදිලි ය. එහෙත් එයට එරෙහි වන්නට මේ මොහොතේ තමන්ට හැකියාවක් තිබේද යන්න මදාරාට තේරුම් ගත නොහැකි ය. එරෙහි වීමෙන් සිදුවන්නේ මේ තාක් කළ කැපවීම වතුරේ යාම පමණකි. විකිණූ ආත්මයේ නියම මිල ගන්නා තෙක් ඉවසා සිටින්නට සිදුවෙනු ඇත.

"මොනාවුණත් තව මාස දෙකයිනෙ.." මදාරා හිත හදාගන්නට උත්සාහ කළා ය.

මතු සම්බන්ධයි

# ශ්‍රීලාල් ගේ කොළම

## වැදි බණ

''මම අද දවල් පන්නිපිටියේ දානේ ගෙදරක ගියා. අයියෝ... ඒ හාමුදුරුවෝ කියපු බණ. මුස්ලිම් මිනිස-'සුන්ට බැනපු එකමයි කළේ. සිංහල ජාතිය නැතිවෙනවලු. මුස්ලිම් මිනිස්සු රට අල්ලනවලු. මුස්ලිම් කියලවත් නෙවෙයි කිව්වේ. හම්බයෝ කියලා. දැන් මේ හාමුදුරුවරු තීරණය කරලලු තියෙන්නේ බණට මේවා කියන්න''
ප්‍රවීණ මාධ්‍යවේදී එස්. පියසේන මහත්තයා මේ කතාව කිව්වේ පහුගිය සති අන්තයේ මම එතුමගේ ගෙදරට ගොඩවුණ වෙලාවක. ඒක කියනකොට මට මතක් වුණා ඊට දවස් දෙක තුනකට කලින් වයසක උපාසක අම්ම කෙනෙක් මට කියපු තවත් කතාවක්.

''ඉස්සර සෝම හාමුදුරුවෝ ඉන්නකොට මම සිල්ගන්න ගියේ මහරගම ධර්මායතනයට. දැන් යන්නේ පනාගොඩ කෑම්ප් එකේ පන්සලට. එතනත් දැන් ධර්මායතනයේ වගේ හොදට පෝදා වැඩසටහන් කෙරෙනවා. පිටින් හාමුදුරුවරු ගෙන්නලා තමයි හැමදේම වගේ කරන්නේ. ඊයේ වැඩිය හාමුදුරුවරු නම් හොදට බණ කිව්වා. සිංහල ජාතිය විනාශ වෙන එක ගැන තමයි හැමෝම වගේ කතා කළේ. තව අවුරුදු විස්සක් යනකොට මුස්ලිම් මිනිස්සු රට අල්ලනවලු. ඇයි ඉතිං සිංහල මිනිස්සු ළමයි හදන්නෙත් නෑනේ. මහණ කරන්නවත් ළමයෙක් හොයාගන්න නෑ කියලා හාමුදුරුවරු කිව්වා පුළුවන් තරම් ළමයි හදන්නලු''

දැන් හැම තැනකින්ම වගේ ඇහෙන්නේ මේ වර්ගයේ බණ. මම හිතන්නේ මේ තමයි අර බොදු බල සේනාවේ කට්ටිය මාසෙකට විතර උඩදී කියපු ''මොඩිෆයි බණ'' කලාව. බොදු බල සේනාවේ ඥානසාර උන්නාන්සේ මාධ්‍ය සාකච්ඡාවකදී කියලා තිබුණා වර්ථමානයේ රටට ගැලපෙන නව ධර්ම දේශනා ක්‍රමයක් හඳුන්වා දෙන්නත් උන්නාන්සෙලා කටයුතු කරන බව.

පහුගිය දශක දෙක තුනක කාලය ගත්තත් ''මේ ගෞතම බුද්ධ රාජ්‍යයේ'' කොයි තරම් බණ වර්ග ප්‍රචලිත වුණාද? දවසක් අසල්වැසියෙකුගේ ගෙදරක තිබුණු බනක් අහන්න මමත් ගියා. බණට වැඩිය ගමේ පන්සලේ හාමුදුරුවෝ ශ්‍රාවකයන්ගෙන් මුලින්ම ඇහුවා කවි බණක් අහන්න කැමතිද කියලා. සර්ධාවෙන් මුසපත් ශ්‍රාවක පිරිස අනුමැතිය පලකළා. ඕං පටන් ගත්තා ''කවි බණ'' පැයකට වැඩිය දෙසා බෑවා. සැලකිය යුතු ඉල්ලුමක් වගේම ඉල්ලුමට සරිලන සැපයුමකුත් තියන බණ වර්ගයක් තමයි කවි බණ. මේ බණවලට නම් දරාපු හාමුදුරුවරුත් ඉන්නවා. ඒ හාමුදුරුවරුන්ට ''කාව්‍ය ශ්‍රී'', ''කවි ධජ'' කිය කියා නොයෙක් ආකාරයේ නම්බුනාමත් තියනවා. බුදු හාමුදුරුවන්ගෙන් අනුමැතිය නොලැබුණත් ඉතාමත් මිහිරි ගායන විලාශයෙන් තමයි මේ කවි බණ කියවෙන්නේ.

''යුගාසන බණ'' කියන්නේ ඉදලා හිටලා විශේෂ අවස්ථාවල අහන්නට ලැබෙන බණ වර්ගයක්. මේකෙදි හාමුදුරුවරු දෙනමක් මාරුවෙන් මාරුවට බණ කියනවා.

පහුගිය කාලේ ''නැගලා ගිය'' තවත් බණ වර්ගයක් තමයි ''කාලීන ධර්ම දේශනා''. බුද්ධ ධර්මය අකාලික වුණත් බුද්ධ පුත්‍රයෝ මේ ''කාලීන ධර්ම දේශනා'' පවත්වනවා.

මේ විදිහේ විවිධ බණ වර්ග අපි හුගදෙනෙක් අහලා තියනවා. අහපු නැති බණ වර්ගත් නැතුවා නෙවෙයි. මම පැංචා කාලේ අපේ අම්මා කියනවා මට මතකයි ''ජේතවනාරාමෙට ගල් ගහලා වැද්දන්ගෙන් බණ අහලා'' ආව අයගේ කතාවක්. ඒ කතාවේ පූර්වාපර සිද්ධි ගලපා ගන්න නම් එදා වගේම අදත් මට අමාරුයි. කොහොම වුණත් මේ විදිහට බණ වර්ග විශාල ප්‍රමාණයක් අපි වටේ රැව් පිළිරැව් දෙනකොට මොන බණද අපි පිළිගන්න ඕනේ කියන ගැටළුව කෙනෙකුට මතුවෙන්න පුළුවන්.

මට හිතෙන්නේ අපි අහන්න ඕනෙත් පිළිගන්න ඕනෙත් ''බුදු බණ'' කියලයි. පනාගොඩ හමුදා පන්සලේ (''පඬිකපනාරාමය'') පෙහෙවස් සමාදන් වෙනවා කියූ අර වයසක උපාසකම්මත් එක්ක ටිකක් දිගට කතාව යන අතරේ මම ඇහුවා ''බුදු බණ කොහෙද තියෙන්නේ කියලා'' උපාසක අම්මා කල්පනාවට වැටුණා. වෙලාව ගතවෙනවා.

බුදු හාමුදුරුවෝ මුලින්ම දේශනා කළ සූත්‍රය මොකක්ද'' ඒ මම. ඔන්න උපාසක අම්මගේ සතිය අවදිවුණා. ''ධම්මචක්ක පවත්තන සූත්‍රයනේ.'' එක සැරේටම කියවුණා.

''ආ ඒකේනේ ඔක්කොම තියෙන්නේ'' ඊළගට කියවුණා.
මේ උපාසක අම්මගේ වගේම හුගදෙනෙකුගේ ධර්මාවබෝධය වර්ථමානයේ ක්‍රියාත්මකවන ''බණ කලා''වලින් යටපත් කරලයි තියෙන්නේ. මහ ලොකු බුද්ධාගම්කාරයෝ වුණත් අපිට බුදු බණයි වැදි බණයි වෙන්කරලා හදුනාගන්න බැරි තත්ත්වෙකට අපි පත්වෙලා නේද කියලා මට හිතුණා.

මේ වෙසක් මාසේ නිමක් නැතුව ඇහෙන බණ අතරේ බුදු බණ පදයක් අහන්න අපි උත්සාහ කරන්න ඕනේ. පස්වග තවුසන් සමඟ කාලයක් තිස්සේ ආර්ය පර්යේෂණයක නියැළුණ සිද්ධාර්ථ තාපසයන් අවසානයේ ඔවුන්ගෙන් වෙන්ව වනගත වෙනවා. තනිවම දීර්ඝ කාලයක් තමන්ගේ පර්යේෂණයේ නිරත වෙනවා. එහි අවසානය තමයි බුද්ධත්වය. ඉන් පසු නැවතත් තමන්ගේ පැරණි මිතුරු පස්වග තවුසන් වෙත පැමිණෙන බුදුන්වහන්සේ ඔවුන්ගෙන් අහන ප්‍රශ්ණය තමයි තමන් සොයාගත් අලුත් ධර්මය අසන්නට කැමතිද කියන එක. කැමතියි කීවිට බුදුහාමුදරුවෝ සොයාගත් අලුත් ධර්මය දේශනා කරන්න පටන්ගන්නවා. බස්නාහිරෙන් හිරු බැසගෙන යමින්ද නැගෙනහිරින් පුර සඳු පායා එමින්ද තිබෙන අතිශය සුන්දර සැන්දෑ යාමයේ ඇරඹෙන ඒ ධර්ම දේශනාව අවසාන වෙනකොට පස්වග මහණුන් අතරින් කෙනෙක් ධර්මාවබෝධයට පත්වෙලා. මේකෙන් ඉතාම පැහැදිලියි බුදු දහමේ සමස්ථය ධම්මචක්ක පවත්තන සූත්‍රයේ අන්තර්ගත බව. ඉන් පසු පන්සාලිස් වසක්ම බුදුන්වහන්සේ කළ සියළු දේශනා මුල් සූත්‍ර ධර්මය පිළිබඳ කළ වැඩිදුර කරුණු පැහැදිලි කිරීම් කියලයි මට හිතෙන්නේ.

ඒත් අද අද ඇහෙන ''බණ'' හරිම වෙනස්.
''කිං කුසළ ගවේෂී''
''කිං සච්ච ගවේෂී''




# Why are we here?

Have you ever just stopped and thought for a while
As to why today we may be alive
And call this planet named Earth our home
When there are other planets on which we could roam
Even before the dinosaurs a different species could have lived on this soil
Who created us so that all day and night we could toil
To look after the planet called Earth
Which may be close to their heart
Or maybe we are here as gods will
Along with every animal and hill
To look after their creation so grand
It is all in our hand
Have you ever just stopped and thought for a while
As to why today we may be alive

Recently a teacher asked me a question that made me stop and think. Why do we the human race occupy the Earth? What is our purpose? Nearly every single person will come across this question once in their life time and their answer will vary according to what they believe. Are we here as some other worldly beings master plan? Or were we created to look after the planet Earth?

There are numerous ways that someone could approach this question. Some people will think scientifically and logically while others might think spiritually. I asked my younger sister why she thinks we are here on Earth and her response was simply "that is how it has always been." This in fact is very true. Since the beginning of the human civilisation we have all called Earth our home. But what is the purpose of us being on Earth? This is a million dollar question but even if millions of dollars were invested in finding the answer we will never really know why.

Never the less I wanted to know what other people thought about this question, so I asked my dad and he gave me a very thought-provoking answer. He told me about beautiful Gaia, the Greek Goddess for Earth. Being so beautiful and alive – our mother Earth is a Goddess indeed. Our duty as humans is to look after the Earth as a goddess and each other. We are here to help our environment and each other thrive.

I then asked one of my close friends and she told me that she thinks we are here as some other worldly beings master plan. Her theory was that when the Earth was first created, it was inhabited with a species that was ten times smarter than us. One day another planet was discovered that would accommodate their needs better so they decided that they would leave this planet and occupy that planet. Never the less they felt as though they could not leave the Earth unguarded so they created us the human species to look after it. Although this idea is very hard to believe, it is possible that extra-terrestrials once used to live on Earth. Then she told me that lately there have been multiple UFO sightings around the world. Why would that be? Were the first inhabitants checking up on their beloved planet Earth to make sure that we were looking after it properly? This was hard for me to believe but we will never know the truth and this could have been a possibility.

Some say the Earth itself has created us and all living beings, to look after the Earth. There is a hidden danger associated with this idea. If living beings fail to look after the Earth or an intelligent race as Humans try to destroy it, the Earth will not hesitate to get rid of us quickly.

No doubt that many of you have various reasons for why we are here on Earth or what our purpose is. Never the less we are grateful that we found somewhere as resourceful and beautiful as Earth to call home. We inherited this wonderful home from our ancestors only to live well and pass it to our future generations – the future inhabitants. The Earth is our life. It is the air we inhale, pure sweet water which we drink, enriched soil which we cultivate our food, trees and greeneries which purify the air & soil. We and all other living beings who share these inheritance of our mother Earth have right to live in this beautiful plant freely and happily. I believe we are here because our ancestors treated Earth as a goddess, with lot of love, care and devotion. Our purpose is to ensure that future inhabitants inherit this beautiful home – mother Earth in the same condition as we inherited from our ancestors.







